ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 03 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I -2023 / 2024
LLU 3604 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I
කාලය පැය 01 යි.

දිනය : 2024 ඔක්තෝබර් 24

වේලාව: ප.ව 1.30 - ප.ව 2.30

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

01. "ආණ්ඩුව වනාහි ජනතාව විසින් බලාත්මක කරනු ලබන සහ ජනතාව උදෙසා ක්‍රියාවට නැංවෙන ක්‍රියාකාරකම් සමූහයක්ය යන සරල ප්‍රස්තුතය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය ගොඩනැගී ඇති නමුදු එම ආණ්ඩුව පාලනය කිරීමට ජනතාව විසින් කැඳවනු ලබන පාර්ශවයන් සිය බලය අනිසි ලෙස භාවිත නොකරන බවට සහතික කෙරෙන සීමාවන් මාලාවකට යටත් වේ."

Carl J. Frederich, Constitutional Government and Democracy: Theory and Practice in Europe and America ( rev.ed., Ginn and Company : Boston 1950) 35

ඉහත ප්‍රකාශය ඇසුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ සිද්ධාන්තය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයක් උදෙසා එම සිද්ධාන්තයෙහි පවත්නා වැදගත්කම සාකච්ඡා කරන්න.

**( ලකුණු 20 )**

02. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය සලකා බැලීමේදී , එකල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් සතුටුදායක අන්දමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලනයකට අදාළ පුළුල් සංකල්පයන් විෂයෙහි අනුගත වීමට අපොහොසත් විය. එහෙත් පැවති රාජාණ්ඩු ක්‍රමයෙන් වියුක්ත වෙමින් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම උදෙසා අවශ්‍ය වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ මූලාරම්භය සනිටුහන් කිරීම එනයින්ම බැහැර කළ යුත්තක් නොවේ.

ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නෙහිද ?

ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පිණිස නිදහසට පෙර කාලසීමාව ඇතුළත හඳුන්වා දුන් වැදගත් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ ආශ්‍රයෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

**( ලකුණු 20 )**

*** හිමිකම් ඇවිරිණි ***